# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# ජපන්/ කොරියන්/චීන/ හින්දි/ ප්‍රංශ භාෂා සහතිකපත්‍ර / උසස් සහතිකපත්‍ර - 2026

**ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් :**

ජපන්/ කොරියන්/ චීන / හින්දි/ ප්‍රංශ භාෂා සහතිකපත්‍ර පාඨමාලාව

(SLQF Level 1/ NVQ Level 3)

- 9 ශ්‍රේණිය සමත් වයස අවුරුදු 16 සම්පූර්ණ කළ ජපන්/ කොරියන්/ චීන/ හින්දි/ ප්‍රංශ භාෂා ඉගෙනීමට උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට අයදුම් කළ හැකිය.

**ජපන්/ කොරියන්/ චීන/ හින්දි/ ප්‍රංශ භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව**

(SLQF Level 2/ NVQ Level 4)

- මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ජපන්/ කොරියන්/ චීන/ හින්දි/ ප්‍රංශ භාෂා සහතිකපත්‍ර පාඨමාලාව සමත්වීම.

**හෝ**

- අ.පො.ස. සා/පෙළ විභාගය විෂයයන් හයකින් (06) සමත් වීම හෝ ඊට සමාන සුදුසුකමක් සහ මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ස්ථානගත කිරීමේ පරීක්ෂණයෙන් සමත්වීම. (අ.පො.ස. සා/පෙළ විභාගයේදී ජපන්/ කොරියන්/ චීන / හින්දි/ ප්‍රංශ විෂයයට C සාමාර්ථයක් හෝ ඊට සමාන සාමාර්ථයක් ලබා ඇත්නම් ස්ථානගත කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය නොවේ.)

**උසස් සහතිකපත්‍ර පාඨමාලාව සඳහා ස්ථානගත කිරීමේ පරීක්ෂණය :**

අයදුම්පත් භාරගෙන අවසන් වීමෙන් පසු විශ්වවිද්‍යාලය විසින් දැනුම් දෙනු ලබන සති අන්ත දිනක දී ස්ථානගත කිරීමේ පරීක්ෂණය කොළඹ 07, අංක 214, බෞද්ධාලෝක මාවත, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලීය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණයේදී දක්වන කුසලතාවය මත සිසුන් අදාළ පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

| | | |
|---|---|---|
| අධ්‍යයන මාධ්‍යය | : | සිංහල/ඉංග්‍රීසි |
| දේශන පැවැත්වීම | : | මාර්ගගතව හා භෞතිකව |
| පාඨමාලා කාලය | : | මාස 06 කි. |

(ජපන්/ කොරියන්/ චීන/හින්දි/ ප්‍රංශ භාෂා දේශන සෙනසුරාදා දිනවලදී පැවැත්වේ.) සියලුම පාඨමාලා දේශන 2026 අප්‍රේල් මස ආරම්භ කිරීමට නියමිතය.

**ගාස්තු:**

| | | |
|---|---|---|
| සහතික පත්‍ර පාඨමාලා | : | රු. 20,000/- |
| උසස් සහතික පත්‍ර පාඨමාලා | : | රු. 25,000/- |

(පාඨමාලා ගාස්තු වාරික වශයෙන් ගෙවිය හැකිය. විශ්වවිද්‍යාලය වෙත මේ සම්බන්ධව ගෙවූ කිසිදු මුදලක් ආපසු නොගෙවනු ලබන බව කරුණාවෙන් සලකන්න.)

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරය:**

පාඨමාලා පිළිබඳ විස්තර හා අයදුම්පත් පැමිණ ලබා ගන්නේ නම්, 2026.03.23 දින දක්වා ප.ව. 3.00 ට පෙර **214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ** පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ සරප් වෙත මුදල් ගෙවා හෝ දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ අංක 711202 දරන ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ය.

තැපැල් මගින් අයදුම්පත් හා විස්තර ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, ඉහත ඡේදයේ පරිදි රු. 500/- ක අයදුම්පත් ගාස්තුව ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9x4 ප්‍රමාණයේ, රු. 50/- ක මුද්දර ඇලවූ කවරයක් **පහත සඳහන් ලිපිනයට 2026.03.23 දිනට පෙර එවීමෙන්** ලබා ගත හැකි ය. **චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ **පාඨමාලාවේ නම සඳහන් කර** ''අයදුම්පත්‍ර ලබා ගැනීම'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

**සහකාර ලේඛකාධිකාරී**
**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය.**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ**
**214, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

විශ්වවිද්‍යාලයේ **www.bpu.ac.lk** යන වෙබ් අඩවිය මගින් ද අයදුම්පත් ලබා ගත හැකිය. වෙබ් අඩවියෙන් ලබා ගන්නා අයදුම්පත් භාරදීමේ දී රු. 500/- ක අයදුම්පත් ගාස්තුව ගෙවූ බැංකු රිසිට්පත සම්පූර්ණ කළ අයදුම්පත් සමඟ අමුණා එවිය යුතු ය.

සැ.යු. බැංකුවට අයදුම්පත් ගාස්තු ගෙවීමේ දී ''Other''ලෙස ලදුපතෙහි තැන්පත්කරුගේ නම ඉදිරියෙන් සටහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026.03.26 වේ. නිසියාකාරව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ඉහත ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් එවනු ලබන කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන පාඨමාලාවේ නම ''ජපන්/ කොරියන්/ චීන/හින්දි/ ප්‍රංශ භාෂා සහතිකපත්‍ර / උසස් සහතිකපත්‍ර අයදුම්පත'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

**වැඩි විස්තර සඳහා: 0112 580 609/0112 502 944/011 259 3604**
**පාඨමාලා සමායෝජක : 071 243 3662**
**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**
**2026.02.26**